# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/15 - 2022 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2022.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

**14 වැනි වගන්තිය යටතේ නියෝගය**

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2020 නොවැම්බර් මස 17 වැනි දිනැති අංක 2202/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියෝගය තවදුරටත් සංශෝධනය සඳහා එකී නිවේදනයේ *ඇමුණුම - ඒ* යටතේ, මෙම නියෝගය මගින් 2022 ඔක්තෝබර් මස 06 වැනි දින සිට නව ඡේදය (xxi) ඇතුළත් කරමි.

(xxi) කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, දේශීය සනීපාරක්ෂක තුවා නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3920.10.90 (අනෙකුත් - *පොලිඑතිලීන් පටල* (ඩබ්)), 3926.90.99 *(පොලිප්‍රොපිලීන් පටල)* සහ 4811.59.10 *(සිලිකන් ආලේපනය කළ)* යටතේ වර්ගීකරණය වන අමුද්‍රව්‍ය හෝ අන්තර් භාණ්ඩ ආනයනය.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
කොළඹ 01,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 10 - 0038

1A - PG 6002 — 481 (2022/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*